# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව : අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක්

**චන්දිම බණ්ඩාර අඹන්වල**[1]

ක්‍රිස්තු වර්ෂ 1863 දී ඉන්දියාවේ මදුරාසියේ දී ආර්. බී. ෆූටේ විසින් ශිලාමෙවලමක් සොයාගැනීමත් සමඟ දකුණු ආසියා කලාපයේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා පර්යේෂණ ආරම්භ වූ බව සැලකේ. එයින් විසිවසරකට පමණ පසු, ක්‍රි.ව. 1885 දී ජෝන් පෝල් විසින් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් මානව නිර්මිත යැයි සැලකූ ගල්පතුරු රැස්කිරීමෙන් දිවයිනේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ සඳහා පදනම වැටිණ. ඒ අනුව, ලංකා පුරාවිද්‍යා සමීක්ෂණයේ ආරම්භයටත් වඩා පැරණි අතීතයක් ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාවට හිමි වී ඇත.

සියවසරක් ඉක්ම වන ලංකා ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ අතීතයේ, ගුණාත්මක ලක්ෂණ අනුව (1) ආරම්භයේ සිට ක්‍රි.ව. 1940 දක්වා **ආරම්භක අවධිය**, (2) ක්‍රි.ව. 1940 සිට 1970 දක්වා **අතරමැදි අවධිය** හා (3) 1970න් පසු අද දක්වා අවධිය **නූතන අවධිය** ලෙස ප්‍රධාන අවධි ත්‍රිත්වයක් හඳුනාගත හැකි වේ. විවිධ විෂයක්ෂේත්‍ර ඔස්සේ පුරාවිද්‍යාව වෙත ආකර්ෂණය වූ පුද්ගලයන් විසින් සිදුකරන ලද ශිලාමෙවලම් හා දත්ත රැස්කිරීම මෙන් ම විධිමත් සැලැස්මකින් තොර කැණීම් ආදිය පළමු අවධියේ දී හඳුනාගත හැකි අතර මධ්‍යම කඳුකරය වෙත වැඩි අවධානයක් යොමුකරමින් දිවයින පුරා අධ්‍යයන දියත් වෙයි. මානව ඓතිහාසිකත්වය හා පරිණාමය පිළිබඳ විදේශයන්හි වර්ධනය වන දැනුමට සාපේක්ෂක ව විවිධ පුද්ගලයන් තුළ ඇති කුතුහලාත්මක ආශාව මෙම අධ්‍යයන සඳහා පාදක විය. අතරමැදි අවධියේ දී දේශිය විද්වතුන් වෙත මෙම පර්යේෂණ සංක්‍රමණය වන අතර පී.ඊ.පි. දැරණියගල එහි කැපීපෙනෙන කාර්යකොටසක් ඉටුකරයි. සත්වවිද්‍යාව ඔස්සේ පුරාවිද්‍යාවට ආගමනය වූ පී.ඊ.පී. දැරණියගල විසින් රටේ නොයෙක් ස්ථානයන්ගේ නොයෙක් තත්ත්ව යටතේ පර්යේෂණ දියත් කරන ලදී. 1970න් ඇරඹෙන නූතන අවධියේ දී තීරණාත්මක සම්පත් දායකයා වශයෙන් එස්.යූ. දැරණියගල කැපී පෙනේ. විධිමත් සැලැස්මකින් යුක්ත ව, ගැටලු අභිමුඛ හා උපන්‍යාස මූලික ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාවක් දක්වා පර්යේෂණ වර්ධනය වන

[1] සාමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
Email: chandimaambanwala@yahoo.com

මෙම අවධිය විග්‍රහාත්මක අවධියක් වේ. මෙම නූතන අවධිය දිවයිනේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණයන්ගේ ඵලාගම අවස්ථාවක් වශයෙන් ද හඳුනාගත හැකිය. නූතන යුගයේ දෙවන භාගයේ දී නිදහස් අධ්‍යාපනය ඔස්සේ දේශීය තරුණ විද්වත් පරපුර මෙම විෂය ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය වන අතර දේශීය සන්දර්භය තුළ ඔවුන්ගේ අධ්‍යයන, පර්යේෂණ හා චින්තනය හැඩගැසීම සිදු වෙයි.

ස්වදේශී සන්දර්භය තුළ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතා හඳුනාගනිමින් ඒ ඔස්සේ ක්‍රියාත්මක වීම මෙම යුගයේ දී අත්‍යවශ්‍ය වී ඇත. විනාශකාරී ක්‍රමවේද අවම ආකාරයකට භාවිත කරමින් ප්‍රමුඛ හා අත්‍යවශ්‍ය පර්යේෂණ අරමුණු සඵල කරගැනීම සඳහා පමණක් යොමු වීම ද අත්‍යවශ්‍ය වී ඇත. ප්‍රස්තුත ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩ අරභයා විශේෂඥයන් බිහිකර ගැනීම, මහජන දැනුවත් කිරීම හා පර්යේෂණ ඔස්සේ නිර්මිත නව දැනුම් පද්ධතිය පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ සමාජගතකරණය ද ප්‍රාග් ඓතිහාසික පර්යේෂකයන් වෙත තත්කාලීන ව පැවරී ඇති වෙසෙස් කාර්යය අතර වේ.

ප්‍රමුඛ පද: ප්‍රාග් ඉතිහාසය, පී.ඊ.පී. දැරණියගල, එස්. යූ. දැරණියගල, මධ්‍යම කඳුකරය, ප්‍රාග් ඉතිහාසඥයෝ.

**Title:** Pre historic Archaeology of Sri Lanka: A Critical Ananlysis of Past, Present and Future

**Keywords:** Pre History, P.E.P. Deraniyagala, S.U. Deraniyagala, Historic Archaeology